# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |

| | | | | | |
|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1586 /2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 17/12/2023<br>පැය 1120 |

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2023.12.16 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 01 | 01 | 15 | - | - |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරු අදාළ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මීටියාගොඩ උප කඳවුර.**

2023.12.16 වන දින උදෑසන කාලයේ මීටියාගොඩ පොලිස් වසමේ ලෙව්දුව හන්දිය ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා මීටියාගොඩ උප කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 07 මිලිග්‍රෑම් 950 ක් සන්තකයේ තබා ගෙන ත්‍රිපර් රථයකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මීටියාගොඩ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන මීටියාගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. මීටියාගොඩ පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මුලතිව් කඳවුර.**

2023.12.16 වන දින සවස් කාලයේ තලංගම පොලිස් වසමේ බතලවත්ත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා මුලතිව් කඳවුර නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 512 ක්, යතුරු පැදි 01 ක් සහ ජංගම දුරකථන 02 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන කොළඹ මත්ද්‍රව්‍ය නාශක කාර්යංශය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 24 ක් හා 38 ක් වන කඩුවෙල හා මුල්ලේරියාව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ. කොළඹ මත්ද්‍රව්‍ය නාශක කාර්යංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**